# ඇල්ල ප්‍රාදේශීය සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජූනි 21 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 සැප්තැම්බර් 24 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, ඇල්ල ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට ඇල්ල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) කිතල්ඇල්ල ජල යෝජනා ක්‍රමයට අයත් රු.5,045,289 ක් වටිනා වත්කම් විෂයන් 4 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සභාව සතු කිතල්ඇල්ල ජල යෝජනා ක්‍රමය වෙනුවෙන් 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය තෙක් ඉදිකිරීම් සමාගම වෙත ගෙවන ලද මුළු මුදල රු.21,158,046 ක් වන අතර, ඉන් 33% ක්වූ දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.6,982,155 ක් වන ණය මුදල රු.4,920,459 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා 2011 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂය රු.2,061,696 ක අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.33,728,271 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,519,844 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,388,242 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 1,570 | 704 | 581 |
| (ii) | බදු කුලී | 1,891 | 1,175 | 567 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 800 | 868 | - |
| (iv) | වෙනත් ආදායම් | 10,929 | 6,333 | 4,301 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 901,157 |
| (ii) | මුද්දර ගාස්තු | 3,522,850 |

### 2.2.3 බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය හා 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත ප්‍රකාරව සංචාරක සංවර්ධන මණ්ඩලය විසින් අනුමත නවාතැන් පොළවලින් බලපත්‍ර ගාස්තු ලෙස පෙර වර්ෂයේ ආදායමෙන් 1% ක් නොඉක්මවන මුදලක් අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර නොතිබුණි.

### 2.3 අවිධිමත් ගනුදෙනු

ඌව පළාත් පාලන කොමසාරිස්ගේ 2005 මැයි 09 දිනැති අංක සීඑල්ජී/1/ප්‍රා.සභා වාහන දරන ලිපියෙ හා ඊට අදාල සංශෝධන වල උපදෙස් වලට පටහැනි ලෙස සභාපතිවරයා සඳහා අනුමත මාසික ඉන්ධන ප්‍රමාණය ඉක්මවා ඩීසල් ලීටර් 2594.7 ක් වෙනුවෙන් රු.201,649 ක් සභා අරමුදලින් ගෙවා තිබණි.

### 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සභා බල ප්‍රදේශයේ ඉඩමේගම පට්ටියකුඹුර ග්‍රාමයේ පිහිටි මුළු වපසරිය අක්කර 12 රූඩ් 02 පර්චස් 13 ක් වූ රත්නගිරිවත්ත නමැති ඉඩමෙන් අක්කර 02 රූඩ් 01 පර්චස් 30 ක ප්‍රමාණයක් අනුබෙදීම් කර විකිණීම සඳහා පිඹුරුපත අනුමත කිරීමේ දී 10% ක භූමි ප්‍රමාණයක් සභාවට ලබාදීමේ එකඟතාවය පිළිබඳව සභාවේ අවධානය යොමුකර නොතිබුණෙන් සභාවට ලැබිය යුතු පර්චස් 39 ක ඉඩම් ප්‍රමාණයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.